ස.සෙ.කො.චක්‍රලේඛ අංක 01 /2023

මගේ අංකය : ස.සේ.කො./5/1/iii වෙළුම,
සමුපකාර සේවක කොමිෂන් සභාව (වයඹ),
නව පළාත් සභා ගොඩනැගිල්ල,දෙවන මහල,
කුරුණෑගල.
2023.01. ::

වයඹ පළාතේ සියලුම විවිධ සේවා සමුපකාර සමිති,
පළාත් සමුපකාර ග්‍රාමීය බැංකු සංගමය හා,
වයඹ සමුපකාර මහා සංගමය, ස.ණ.ස.සංගම්,
ස.ණ.ස. සමිති, වෙනත් සමිති හා සංගම් වල ගරු සභාපති හා
සාමාන්‍යාධිකාරී වරුන් වෙත,

## සමුපකාර සේවකයින් සඳහා 2023 වර්ෂයේ නිවාඩු

සමුපකාර සේවක කොමිෂන් සභා රෙගුලාසි මාලාව අනුව සමුපකාර සේවකයින්ට හිමිකම් ඇති ප්‍රසිද්ධ නිවාඩු වූ කලී සාප්පු හා කාර්යාල සේවක පනත යටතේ ගරු කම්කරු අමාත්‍යතුමා විසින් ප්‍රකාශයට පමුණුවන ලද දිනයන්ම වේ. මේ අනුව පහත සඳහන් දිනයන් සමුපකාර සේවකයින් සඳහා නිවාඩු දින වශයෙන් කොමිෂන් සභා නියමය පරිදි දන්වමි.

| | | | |
|---|---|---|---|
| 01. ජනවාරි | - 15 | ඉරිදා | - දෙමළ තෛපොංගල් දිනය |
| 02. පෙබරවාරි | - 04 | සෙනසුරාදා | - නිදහස් සමරු දිනය (ජාතික දිනය) |
| 03. අප්‍රේල් | - 13 | බ්‍රහස්පතින්දා | - සිංහල හා දෙමළ අලුත් අවුරුදු දිනට පෙර දිනය |
| 04. අප්‍රේල් | - 14 | සිකුරාදා | - සිංහල හා දෙමළ අලුත් අවුරුදු දිනය |
| 05. මැයි | - 01 | සඳුදා | - ලෝක කම්කරු දිනය (මැයි දිනය) |
| 06. මැයි | - 05 | සිකුරාදා | - වෙසක් පුර පසළොස්වක පෝය දිනය |
| 07. මැයි | - 06 | සෙනසුරාදා | - වෙසක් පුර පසළොස්වක පෝය දිනට පසු දිනය |
| 08. සැප්තැම්බර් | - 28 | බ්‍රහස්පතින්දා | - (මිලා- දුන්- නබි)නබිනායක තුමාගේ උපන් දිනය |
| 09. දෙසැම්බර් | - 25 | සඳුදා | - නත්තල් උත්සව දිනය. |

02. ඉහතින් දැක් වූ විධිවිධාන වලට අතිරේකව සේවකයින් අතරින්,

* හින්දු භක්තිකයෙකුට දීපවාලී දිනය ද,
* මුස්ලිම් භක්තිකයකුට රාමසාන් උත්සවය හා හජ්ජි උත්සවය පැවැත්වෙන දිනය ද,
* ක්‍රිස්තු භක්තිකයෙකුට මහ සිකුරාදා සහ පාස්කු ඉරිදා වශයෙන් හැඳින්වෙන දිනය ද,

සම්පූර්ණ වැටුප් සහිත නිවාඩු වශයෙන් දිය හැකිය.

03. පසළොස්වක පොහොය දිනය වැටුප් සහිත නිවාඩු දිනයක් ලෙස සැළකිය යුතුය. පෝය නිවාඩු දිනයක් සති නිවාඩු දිනකට හෝ ප්‍රසිද්ධ නිවාඩු දිනයකට වැටුනහොත් ඒ සඳහා අතිරේක නිවාඩුවක් හිමි නොවේ. තවද, සමුපකාර සංවර්ධන කොමසාරිස්/රෙජිස්ට්‍රාර් (වයඹ) විසින් සමුපකාරිකයින්ගේ දිනය වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලබන දිනයද නිවාඩු වශයෙන් දිය යුතුය. මීට අමතරව රජය විසින් අවස්ථාවෝචිත පරිදි "රජයේ නිවාඩු" දිනයන් ලෙස ප්‍රකාශයට පත් කරනු ලබන දිනයන් සඳහා සිය සේවකයින්ට නිවාඩු දෙන ලෙස ඉල්ලීමක් කළ හොත් එවැනි අවස්ථාවල සමුපකාර සමිතිවල අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණය පරිදි තම සේවකයින්ට නිවාඩු දීම පිළිබඳව තීරණය කළ හැකිය.

04. උක්ත දිනයන් නිවාඩු දින වශයෙන් යොදාගෙන ඇති බැවින් පාරිභෝගිකයින්ගේ පහසුව තකා යම් සමිතියක් කැමැත්තේ නම් සමිති කාර්යාල හෝ ප්‍රාදේශිකයන් මේ දින වල විවෘතව තැබීමටත්, එම දින වල වැඩ කිරීම සඳහා සේවකයින්ට උපදෙස් දීමටත් කොමිෂන් සභාවේ අනුමැතිය ලැබේ. එසේ ක්‍රියා කරනු ලැබූ විට දී ඉහත සඳහන් පරිදි සේවයේ යොදාගත් සේවකයින්ට එසේ සේවයේ යොදා ගත් දින ගණනට සමාන දින ගණනක් සම්පූර්ණයෙන්ම වැටුප් සහිතව ඊළඟට එන දින 30 ඇතුලත දී නිවාඩු ලබා දිය යුතුය. මෙසේ සමිති කාර්යාලයක්, ව්‍යාපාරික ස්ථානයක් විවෘතව තබන අවස්ථාවේදී සේවයේ යෙදවීමට උපදෙස් දෙනු ලැබුවේ මුළු සේවක සංඛ්‍යාවම වුවත්, ඉන් කොටසක් වුවත්, නොපමාව ඒ බැව් කොමිෂන් සභාව වෙත වාර්තා කළ යුතුය.

05. ඉහත දැක් වූ නිවාඩු දින වලින් කිසිවක් සමිතියේ සතිපතා දෙන නිවාඩු 1 1/2 තුළට ඇතුලත් වුවහොත් ඒ වෙනුවෙන් පිළිවෙලින් අඩදිනක් හෝ සම්පූර්ණ දිනක් නිවාඩු වශයෙන් ඊළඟට එන දින 30 ඇතුලත දී සේවකයින්ට නිවාඩු වශයෙන් ලබා දිය යුතුය. මීට විකල්ප වශයෙන් දෙපක්ෂයේ එකඟතාවය ඇතිව ඒ වෙනුවට දින භාගයක් හෝ එක් දිනක වැටුප හෝ අවස්ථාවෝචිත පරිදි ගෙවීම් කළ හැකි වේ.

කොමිෂන් සභා නියමය පරිදි,

එච්.එම්.පී.කේ.හේරත්
ලේකම්
සමුපකාර සේවක කොමිෂන් සභාව(වයඹ)

පිටපත්- :

1. ප්‍රධාන ලේකම් - වයඹ පලාත. - කා. දැ.පි.
2. ලේකම්, සමුපකාර සංවර්ධන, වෙළඳ,ඉඩම්,විදුලිබල හා බල ශක්ති , ක්‍රීඩා හා යෞවනකටයුතු, සංස්කෘතික, කලා කටයුතු සහ තොරතුරු තාක්ෂණ අමාත්‍යාංශය (වයඹ) - කා.දැ.පි.
3. සමුපකාර සංවර්ධන කොමසාරිස්/රෙජිස්ටාර්(වයඹ පළාත) - දැ.පි හා අ.ක.ස.
4. සියළුම සමුපකාර සේවක කොමිසන් සභා ලේකම්වරු - දැ.පි.හා අ.ක.ස.
5. සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් - කුරුණෑගල,හලාවත,කුලියාපිටිය, මහව. - දැ.පි හා අ.ක.ස